

# කොරටුවෙගෙදර අප්පුහාමිගෙ හැල්ල

## පොසොම් පෝයට

ප්‍රමාදයක්

ජූලි සන්නසේ 'අප්පුහාමිගේ හෑල්ලේ කොටසක් කිසියම් ප්‍රමාදයකින් හැලී ගොස් ඇත. එය නැවත මෙසේ පළ කරමු.

පොසොම් පෝයට සිල් ගන්න සිරියාවතී හාමිනේ සූජානං උනේ වෙසක් පෝය පහු උනු දා ඉඳලයි උන්දෑට තිබුනු එක ම සුදු සාරියෙ කහ පැල්ලං මතු වෙලා. ඇයි ඉතිං ඒක එලි බහින්නෙ මාස හත අටකට නැත්තං අවිරුද්දකට විතර සැරයක් නේ ! මං ඇහුවා 'අපි ගම්පහ ගිහිං අලුත් සාරියක් ගම්මුද?' කියලා. "ඕන්නැහ්, මං ඕක පැල්ලං ඇරලා හදා ගන්නං" කියලා උන්දෑ කිව්ව හින්දා මාත් කර බා ගත්තා.

කිව්වත් වගේ ඒකෙ පැල්ලං ඇරලා සුදු කර ගෙන හරියට අලුත් සාරියක් වගේ ඇඳ ගෙනයි එදා අෑ සිල් ගන්න පන්සලට යන්න සූජානං උනේ. පෝය දාට සිල් ඇත්තන්ට දානෙ සැපයෙන්නෙ පන්සලෙං. කීපදෙනෙක් හව්ලෙ ඒ වැඩේ පටං ගත්තේ මාස හත අටකට ඉස්සර.
අපේ පන්සලේ නායක හාමුදුරුවෝ - නාරද හාමුදුරුවො ටිකක් අමුතු පෙරලිකාර අදහස් තියන කෙනෙක් බව මං දැනං හිටියා. පොසොම් පෝය දා උදේ අටට විතර පන්සල් පැත්තෙ එන්න කියලා හාමුදුරුවංගෙං මටත් පනිවිඩයක් තිබුනා. සිරියාවතී හාමිනේ පිටත් වෙලා පැයකට විතර පස්සෙ මාත් මූනකට හෝද ගෙන මගේ කැලෑ කෝට්ටෙකත් ඇගේ දවට ගෙන පන්සල පැත්තට ගෑටුවා.

"අප්පෝට සිරි" පන්සලේ ලැගුංගේ පිටිපස්ස පැත්තෙ හරි යුද්දෙ. මහ කල්දේරං හතරක් ලිපේ හරියවට දරසෑම ගිනි තියාපුවා වගේ. ගෑනු පිරිමි දහ දොළොස් දෙනෙක් එතන. හරියට වයිං කොරපු ජපම් බෝනික්කො වගේ. සමහරු ලිප්වලට දර දානවා. සමහරු පොල් ගානවා. තවත් සමහරු පොල් මිරිකනවා. හාමුදුරුවො නේද, අන දෙන නිලදාරියා වගේ සැරින් සැරේ එතෙන්ට එනවා, ලිප්වල තියන කල්දේරං වලට එබිකම්පානවා. මාලු හැඳි ගානවා, පිහමනේ වැඩ කරන අයත් එක්ක කතා බහ කරනවා. උන්නාන්සෙත් එදා හරි 'බිසි'.

මං දැක්ක ගමං හාමුදුරාවො තල්ලට අල්ල තියා ගෙන, 'මං මේ මඟ බල බලා උන්නා, අප්පුහාමි තාම නැත්තෙ මොකද කියලා. කමන්නෑ, කමන්නෑ, ඕනවටත් වැඩිය පිරිස ඉන්නවා. එහෙනං අප්පුහාමි මේවයි ලුනු ඇඹුල් බලලා අඩු පාඩු කියන්නකෝ. 'හීතල ඇනුම් පදයක් කීවා.

මං ඉතිං හාමුදුරුවන්ට වැදලා, උගුර කට පාද ගෙන, 'හාමුදුරුවො පන්තියක් දාන බව කිව්වා නං මාත් පාන්දරිං එනවා නෙ ! යි කීවා.

"මං හිතුවා අප්පුහාමි ඔය් වගේ උත්තරයක් දේය කියලා.
කියූ හාමුදුරුවො මගේ කරට අත තියාන ලැගුංගේ පැත්තට ගියා. "අද මම්මේ කියන කතාව අප්පුහාමිගෙං පිට යන්න ඕන්නෑ. ඇහුනයි? අද මගේ උපන්දිනේ. හැට ඉවරයි. ඒ හින්දා මාත් අද බර්ත්ඩේ පාටියක් සූජානං කලා. අවිරුදු හැටක් කිව්වා ම සෑහෙන කාලයක් නේ ! 'නාකි' කියලා හංවඩු ගැහෙන්නෙ හැට පැන්නාට පස්සෙලු නේ අප්පුහාමි ! නොහැකි කියන එක මලු නේ නැහැකි - නාකි වෙලා තියෙන්නෙ ! ඒ වචනෙ හදාපු මිනිහාගෙ කටේ රත්තරං දාන්න වටිනවා නැද්ද මං අහන්නෙ ! හැබෑට දැන් අප්පුහාමිගේ වයස කීයද?"

"පනස්සයට ඉවරයි හාන්දුරුවනේ !"
"අම්මපෑ ? ඒ උනාට අප්පුහාමි තාම කොල්ලා වගේ නෙෑ . ඇස් දෙක පල්ල."
" අපේ සිරිතාවතී හාමිනෙත් ඕක නිතර ම කියනවා. අපේ හාන්දුරුවනේ.' හාමුදුරුවෝ බඩ අල්ලා ගෙන සිනාසෙමින් "හා හා යං යං! කියමින් මා සමඟ ඉදිරියට ගියා.

එදා එකොලහමාර වෙනකොට උපාසක දානෙ සූජානං. කැකුලු හාලෙ බතුයි, පොලොස් පැහියයි, අඹ මාලුවයි, තක්කාලි හොද්දයි දුන් දම දමා "අපි රෙඩී අපි රෙඩී" කිය කිය එලාංපු ගෝනි උඩට වෙලා බලං ඉන්නවා. උපාසක ඇත්තො හතලිස් දෙනෙක් විතර දාන සාලාවෙ ඉඳ ගෙන. නාරද හාමුදුරුවො පොඩි හාමුදුරුවො තුන්නමකුත් එක්ක එතනට ආවා. "මේ ඇත්තො දැන් දානෙ වලදන්න සූජානන් නෙහ්? හැමදාම මේ ඇත්තො අපට දානෙ පිලි ගන්නනවා. අපට උපස්තාන කරනවා. අද මේ ඇත්තන්ට දානෙ අපෙං - පන්සලෙං. සියලු ම දේ අපෙං. දානෙ පිලිගන්නන්නෙ අපි. හැබැයි දානෙ ඉව්ං පිහුං වැඩ නං කළේ මේ පිංවතුං. ගමේ ම ඇත්තෝ අපේ අප්පුහාමිනං..... ආවෙ හමාර කියන කොට. කමක් නෑ අප්පුහාමි මට උදව් කරන්නෝන" කියලා හාමුදුරුවො සිව්ර ඉනේ ඔතා ගත්තා.

අපි කව්රුත් කට ඇර ගෙන බලං හිටියා. හාමුදුරුවංගෙ ඉඟියට අනුව මං බත් බාජනේ අතට ගත්තා. හාමුදුරුවො උපාසක ඇත්තන්ට බත් බෙදුවා. උපාලි හාමුදුරුවෝ පොලොස් පැහි බෙදුවා. සෝබිත හාමුදුරුවො අඹ මාලු බෙදුවා. සුමේද හාමුදුරුවංගෙ අතේ තක්කාලි හොදි බාජනේ.

"සුමේද, තක්කාලි හොදි හීරවන්නෙ නැතුව හෙම්මිං බෙදන්න. අතිං පිඟාන වැහුවොත් බෙදන්න එපා. සමහරුන්ට තක්කාලි අගුනයි නේ !"
"ඇයි හාමුදුරුවනේ, පොල් සම්බල?" පන්නල හාමිනේ දුර ඉඳ ගෙනම ඇහුවා.

"බොලේ... හැබෑට මට ඒක හාංකවසියක් මතක් උනේ නෑ. අනේ පන්නල හාමිනේ තරහ නැතුව ඒ වැඩේ පටං ගත්තොනං..."

හාමුදුරුවො කීවා. විතරයි පන්නල හාමිනේ දුවගෙන ගිහිං පොල් සම්බල් බාජනේ අතට ගත්තා. හාමුදුරුවො කියන කොයි වැඩක් උනත් 'නෑ බෑ' නොකිය කරන කෙනෙක් පන්නල හාමිනේ. ගමේ කොයි කව්රුත් ඒක දන්න විත්තිය පන්නල හාමිනෙත් දන්නවා. බේබි අක්කා පස්සට හැරුනා කඩියෙක් කාපුවා වගේ. අනුමාන නෑ, නොන්නො අක්කා බේබි අක්කගේ පස්ස පැත්ත කොනිත්තන්න ඇති.
වෙලාව දොලහට කාලයි දම්බෙදීම ඉවර නෑ.

"හාමුදුරුවනේ, දැන් දොලහට කිට්ටුයි. හාමුදුරුවො වැඩේ අපට බාර දීලා දානෙට වැඩියා නං..." මම ඔර්ලෝසුව දිහෑ බලා ගෙන යි කීවෙ.

"අඃ එහෙමද? කාරි නෑ. මං මේ කරන්නෙ ඉතාම වැදගත් වැඩක්. මං ඊයේ ජනාදිපතිතුමාට 'පැක්ස් පණිවිඩයක් දුන්නා පොසොම් පෝයදාට ලංකාවෙ වෙලාව පැයක් පස්සට දාන්න කියලා" හාමුදුරුවො ඔර්ලෝසුව දිහා බලාගෙන කීවා.

අපි හිටියෙ හිනාව කා ගෙන. මං හොරැහිං අපේ සිරියාවතී උපාසකම්මා දිහෑ බැලුවා. උන්දෑ වමතිං කට වහගෙන හිනාව තද කර ගෙන..






From Page 08

state is becoming managerially superior to the official Sri Lankan state.

## ON DA VINCI CODE, AGAIN

I thank Douglas Fernando for his criticism of my piece on the Da Vinci Code in last month's issue of Sannasa. If Douglas had read the book, he would not have made the charge that Dan Brown was contemptuous of Jesus Christ. On the contrary, Jesus Christ is hailed in the novel as a great spiritual leader who did immense good to humans. The central point Dan Brown makes is that there is adequate evidence to conclude that Jesus was not divine as the church has made him out to be but that he was a human being as Buddha or Mohammed, for instance were. It is also pointed out that Jesus was married to Mary Magdalene and that he had an issue off her so that a holy bloodline had been left behind. This in fact is an old story about Jesus Christ with the difference that Dan Brown cites evidence on behalf of the theory. These are issues that have to be settled by looking at the facts; not by emotion or blind faith. I did not take sides on the issues but simply pointed out that any religion or system of beliefs has to be open to different interpretations by free-thinking individuals. Douglas obviously differs from this view and he prefers to allow beliefs untouched. He supports the banning of the movie. Billions of people build around themselves mental and emotional prisons and prefer to live their lives within these bars. I am not one of them. I like to try and set my mind free and roam to discover the truth rather than allow myself to be conditioned by systems of belief that I have inherited.

## සීයයි මුනුබුරයි



*"සීයාහ් ! සීයා්ට කව්රු හරි තෑග්ගක් දුන්නොත් සීයා කවදා හරි එයාට දෙන්නෙත් එතරමෙම තෑග්ගද්ද?'*
*"නෑ මට හිතෙන්නෙ, බොහෝ වෙලාවට ඊට වැඩිය හොඳ එකක් වෙන්න පුලුවං"*
*"නිස්කාරනේ කව්රු හරි සීයා්ට දොඹ ගෙඩියකිං ගැහුවොත්?"*
*"නිස්කාරනේ මට ගැහුවොත් දොඹ ගෙඩියක් නෙවි දිවිල් ගෙඩියක් මං අතට ගන්නවා"*
*"ඇහ් ? ඊස්රාලලා හිස්බුල්ලලා්ට ගහන හැටියට? ඒක නං හරි නෑ සීයෙ. කව්ද ලොක්කෙකුත් කියලා තිබුනා ගැහිල්ල සැර වැඩි ය කියලා.*
*"අහා ?"*

වික